# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1927/57 - 2015 අගෝස්තු මස 14 වැනි සිකුරාදා - 2015.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 11/80(14).

**1980 අංක 26 දරන ආහාර පනත**

ආහාර උපදේශක කමිටුව විමසා 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය.

2015 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2011 පෙබරවාරි මස 23 වැනි දින අංක 1694/5 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2011 ආහාර (ආනයනික ආහාර ද්‍රව්‍යවල ආයුකාලය) නියෝගවල 2 වන නියෝගයේ අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම නියෝගය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"එසේ වුව ද ඉහත සඳහන් කරන ලද ආයු කාලපරිච්ඡේදය ආනයනය කළ සීනි, තොග වශයෙන් වන පැකට් ආකාරයෙන් වූ ධාන්‍ය සහ ඇට වර්ග, අලුත් පළතුරු සහ එළවලු, ශුද්ධ කරනු නොලැබූ හෝ නොකැපූ රවුම් අල වර්ග සහ මුල් වර්ග සහ දිගටි අල වර්ග සම්බන්ධයෙන් බලාත්මක නොවන්නේ ය.

එසේම තව දුරටත් යම් අයිතමයක ආයු කාලපරිච්ඡේදය අඩු කිරීම මගින් පාරිභෝගිකයාට කිසිම බලපෑමක් ඇති නොවන බවට ප්‍රධාන ආහාර බලධරයා විසින් සෑහීමට පත්වේ නම්, මෙම නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් අයිතමයක් සඳහා වූ කල් අවසන් නොවූ අවම ආයු කාලපරිච්ඡේදය සියයට හතලිහ (40%) දක්වා ප්‍රධාන ආහාර බලධරයා විසින් අඩු කරනු ලැබිය හැකි ය."

08 - 873

1A - G 22168 — 3006 (2015/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*